## විශේෂ සටහන 15
## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: 2016[1]

### මුදල් ප්‍රතිපත්තිය

2016 ජනවාරි 16 - බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 6.00 සිට සියයට 7.50 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් වැඩි කරන ලදී.

2016 පෙබරවාරි 19 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 8.00 දක්වා පදනම් අංක 50 කින් වැඩි කරන ලදී.

2016 ජූලි 28 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.00 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50 කින් වැඩි කරන ලදී.

2017 මාර්තු 24 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 දක්වා පදනම් අංක 25 කින් වැඩි කරන ලදී.

### මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

2016 ජනවාරි 25 - සයිබර් ආරක්ෂණ සිදුවීම් පිළිබඳව නිරීක්ෂණය කිරීමේ අරමුණින්, බැංකුවල සිදුවන එවැනි සිදුවීම් පිළිබඳ තොරතුරු එම සිදුවීම් හඳුනා ගැනීමෙන් එක් වැඩ කරන දිනයක් ඇතුළත සහ කාර්තුවක් අවසන් වී දින 15 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක වෙත දැනුම් දෙන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

2016 පෙබරවාරි 01 - පද්ධතිමය වැදගත්කමක් ඇති ගෙවීම් පද්ධති හරහා සිදු කරන අරමුදල් පැවරීම් සඳහා ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ගාස්තු 2016 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම බැංකු ශාඛාවල ප්‍රදර්ශනය කරන ලෙස සහ තම වෙබ් අඩවිවල පළ කරන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී.

2016 සැප්තැම්බර් 01 - 2016 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු විසින් අනෙකුත් බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් සමඟ සිදු කරන සියලුම ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවට අදාළ වන බ්ලූම්බර්ග් ගනුදෙනු පද්ධතිය යොදා ගත යුතු බව සහ රුපියල් මිලියන 50 ඉක්මවන ස්ථිර පදනම මත වූ අත්පිට ගනුදෙනුවල ඵලදා අනුපාතික සහ ගනුදෙනු පරිමාවන් එම ගනුදෙනු අවසාන වී විනාඩි 30 ක් ඇතුළත වාර්තා කළ යුතු බව සඳහන් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2016 දෙසැම්බර් 29 - 2017 ජූලි මස 01 වන දින සිට සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ඒ ඒ බැංකුවල අවදානම මත බර තබන ලද වත්කම් ප්‍රමාණයන්ට අනුකූල අවම ප්‍රාග්ධන අනුපාතයන් සහ ස්වාරක්ෂකයන් පවත්වාගෙන යාම පිළිබඳව බැංකු පනත යටතේ 2016 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී.

2017 ජනවාරි 10 - බලපත්‍රලාභී බැංකු සඳහා වන ‘බාසල් III තෝලන අනුපාත රාමුව පිළිබඳ උපදේශන පත්‍රිකාව’ නිකුත් කරන ලදී.

2017 ජනවාරි 13 - 2017 ජනවාරි 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් උපරිම වටිනාකම මත ණය අනුපාතයන් අනුගමනය කරන ලෙස බැංකු පනත යටතේ 2017 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී.

2017 පෙබරවාරි 01 - 2017 අයවැය මගින් අනුමත කරන ලද පහත දැක්වෙන කරුණු පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතන, අපනයන කටයුතු, සංචාරක කටයුතු, කෘෂිකර්මාන්තය, තරුණ සහ කාන්තා ආදී හඳුනා ගත් අංශයන් වෙත ණය පහසුකම් සැපයීම
- බැංකු සේවාවන් වැඩිදියුණු කිරීම

අපේක්ෂිත - බලපත්‍රලාභී බැංකු සඳහා තෝලන අනුපාතය හඳුන්වා දීම

- බලපත්‍රලාභී බැංකු සඳහා ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය හඳුන්වා දීම
- බැංකු පරීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම

1 2016 වසර තුළ දී මෙන්ම 2017 වසරේ පළමු මාස තුන තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙයට ඇතුළත් වේ.

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 18 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නව ශාඛාවන් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර විවෘත කිරීම, ශාඛාවන් හා වෙනත් ව්‍යාපාර ඒකක වැසීම හා ස්ථාන වෙනස් කිරීම සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ශක්තිමත් හා විධිමත් කිරීම සඳහා විධාන නිකුත් කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 28 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය සාධන පත්‍ර සඳහා ලබා දිය හැකි උපරිම පොලී අනුපාතික සම්බන්ධ විධානය සංශෝධනය කරන ලදී. |
| 2017 ජනවාරි 13 | - | 2017 වර්ෂය සඳහා වන අයවැය යෝජනාව අනුව යමින්, බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර තිබූ මෝටර් වාහන වෙනුවෙන් ණය පහසුකම් ලබා දීමේ දී ඒවායේ වටිනාකම් මත ලබා දෙන ණය අනුපාතය සම්බන්ධ විධාන සංශෝධනය කරන ලදී. |
| 2017 පෙබරවාරි 23 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනය ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. |

**රක්ෂණය**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 01 | - | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නුබුන්වත් ආන්තික නීති (අවදානම පදනම්ව ගණනය කළ ප්‍රාග්ධනය) සියලුම රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2016 ජනවාරි 04 | - | කොටස් හිමිකාරිත්වයෙහි සියයට 50 කට වඩා වැඩි හිමිකම සහ පාලන අධිකාරිත්වය සම්බන්ධ වෙනසක දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියෝග කරමින් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 96A වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| 2016 මාර්තු 15 | - | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ ඔප්පුව භාර ගැනීම සඳහා රක්ෂිතයා වෙත ලබා දී තිබූ උපරිම කාලය දින 7 සිට දින 14 දක්වා වැඩි කරන ලදී. |
| 2016 අප්‍රේල් 01 | - | රක්ෂණ ඔප්පු හිමියන්ට රක්ෂණ ඔප්පුවෙහි නියමයන් සහ කොන්දේසි පරීක්ෂා කිරීමට දින 21 ක සලකා බැලීමේ කාලයක්/නිදහස් පිරික්සුම් කාලයක් ලබා දෙන ලෙස රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96A වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සියලුම දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| 2016 මැයි 26 | - | රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ තැරැව්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂිත යම් තැනැත්තෙකු, රුපියල් මිලියන 2.5 ට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තබා ගත යුතු බවට නියම කරමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් 2005 අංක 5 දරන නියමය සංශෝධනය කරන ලදී. |
| 2016 සැප්තැම්බර් 30 | - | නව රක්ෂණ ක්‍රම සහ ඒවා හඳුන්වා දෙන දින සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය දැනුම්වත් කරන ලෙස නියම කරමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සියලුම රක්ෂණ සමාගම් වෙත චක්‍රලේඛයක් (අංක 39) නිකුත් කරන ලදී. ඒ අනුව, සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් නව රක්ෂණ ක්‍රම හඳුන්වා දීමට පෙර අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු අතර දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් නව රක්ෂණ ක්‍රම හඳුන්වා දීමට අවම වශයෙන් දින 45 කට පෙර ආයුගණක සහතිකය, රක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය සහ යෝජනා පත්‍රය ඉදිරිපත් කළ යුතුය. |
| 2016 ඔක්තෝබර් 01 | - | පාරිභෝගිකයින්ට කඩිනමින් සහ සාධාරණව සැලකීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පාරිභෝගික පැමිණිලි හැසිරවීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 21 | - | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සම්බන්ධිත දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා පවතින මාර්ගෝපදේශ සංශෝධනය කරන ලදී. ඒ අනුව, ඔප්පුව අවලංගු කරන අවස්ථාවේ පවතින ඒකක වටිනාකමින් අය විය යුතු රක්ෂණ ගාස්තු, ඔප්පු ගාස්තු සහ පැවරුම් ගාස්තු අඩු කළ පසු වන ඒකක වටිනාකමට වඩා ඔප්පුවක පැවරුම් අගය අඩු විය නොහැක. තවද, අවදානම් ගාස්තු කලින් අය කර ගන්නා ආයෝජන හා සම්බන්ධිත නිෂ්පාදනයක පැවරුම් අගය නිශ්චය කිරීමේ දී රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි පැවරුම් අගය නිශ්චය කිරීමේ ප්‍රතිපාදන එවැනි නිෂ්පාදනයක අවදානම් කොටස සඳහා (පමණක්) අදාළ කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 01 | - | රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් රක්ෂණ අංශයේ වෘත්තීමයභාවය සහ ප්‍රතිරූපය නංවාලීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ හිමිකම්පෑම් පිළිබඳව විමර්ශන සිදු කිරීම හා සම්බන්ධ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී. |

**ප්‍රාග්ධන වෙළඳපොළ**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 01 | - | කොටස් හුවමාරු බද්ද ඉවත් කරන ලදී. |
| 2016 අප්‍රේල් 01 | - | කොටස් හුවමාරු බද්ද සියයට 0.3 අනුපාතයකින් නැවත පනවන ලදී. |
| 2016 නොවැම්බර් 17 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවම මහජන හිමිකම් අවශ්‍යතා ප්‍රතිශෝධනය කරන ලදී. |
| 2016 නොවැම්බර් 22 | - | ණය සුරැකුම්පත් පමණක් ගනුදෙනු කරන තැරැව්කාර සමාගම් හැරුණු කොට සෙසු තැරැව්කාර සමාගම් විසින් රුපියල් මිලියන 35 ක අවමයකට යටත්ව, මෙහෙයුම් අවදානම, විශාල ගනුදෙනුකරුවන් හා සම්බන්ධ අවදානම හා අදාළ තැරැව්කාර සමාගම සතු කොටස් සහ සුරැකුම්පත්වල වෙළඳපොළ උච්චාවචනය මත ඇතිවිය හැකි අවදානම ද ඇතුළත් වූ, සමස්ත අවදානම් තත්ත්වය මෙන් වාර 1.2 ක ප්‍රමාණයක අවම ප්‍රාග්ධන අනුපාතයක් 2017 මාර්තු 01 දින සිට පවත්වා ගත යුතු බවට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී. |

**ක්ෂුද්‍රමූල්‍ය**

2016 මැයි 20 - 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත පහත සඳහන් කරුණු සඳහා නීතිගත කරන ලදී.

- ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගම් සඳහා බලපත්‍ර දීම, ඒවා නියාමනය හා අධීක්ෂණය කිරීම
- ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් සීමිත ඉතිරිකිරීමේ තැන්පතු භාර ගන්නා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම
- ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධාන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති ස්ථාපිත කිරීම

\- ක්ෂුද්‍රමූල්‍ය පනත මගින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය ආයතන පරීක්ෂා කිරීම හා අධීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 07 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්ෂුද්‍රමූල්‍ය සංරචකය නැවත ආරම්භ කර දීප ව්‍යාප්තව රුපියල් මිලියන 90 ක් මුදා හැරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2016 ජනවාරි 14 | - | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය සඳහා වන උපරිම සහන කාලය ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන්ට අනුරූපව මාස 06 සිට මාස 12 දක්වා වැඩි කරන ලදී. |
| 2016 අප්‍රේල් 27 | - | ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමයේ අදියර - II ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2016 මැයි 27 | - | 2016 අප්‍රේල් 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා එක් පුද්ගලයෙකුට ලබා දෙන ණය සීමාව රුපියල් 10,000 සිට රුපියල් 300,000 දක්වා වූ පරාසයකට සංශෝධනය කරන ලදී. |
| 2016 අගෝස්තු 03 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන "තරුණ දිරිය" තාරුණ්‍ය සවිබලගැන්වීම සහ රැකියා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2016 අගෝස්තු 22 | - | 2016 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් භෝගයක් ලෙස උක් වගාව ඇතුළත් කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 07 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි "කොන්ත්‍රාත් ගොවීන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය" යටතේ "අගයදාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය" සහ "අගයදාම සංවර්ධන කාලීන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2016 දෙසැම්බර් 20 | - | 2016 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන "තරුණ දිරිය" ණය යෝජනා ක්‍රමය අවසන් වන දිනය 2017 මාර්තු අග දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 පෙබරවාරි 06 | - | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු ගෙවීම සඳහා වූ උපරිම කාලසීමාව ව්‍යාපෘතියේ ස්වභාවය මත, වසරක උපරිම සහන කාලයක් ද ඇතුළත්ව වසර 5 සිට වසර 6 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 පෙබරවාරි 08 | - | ශ්‍රී ලංකා මහ බැංකුව, රජය වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය සහ රැකියා ජනනය කිරීමේ අරමුණින් "ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා" නමින් නව ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | මූල්‍ය ආයතන විසින් ගෙවීම් පහසුකම් සැලසීම සඳහා යොදා ගන්නා ජංගම අයදුම් මෘදුකාංග සඳහා ප්‍රමිතීන් නියම කිරීමට මාර්ගෝපදේශයක් නිකුත් කිරීම |

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 06 | - | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට අදාළ පියවර ගන්නා ලදී. |
| 2016 ජනවාරි 27 | - | 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සඳහා වන විශේෂ ගැසට් පත්‍ර අංක 1951/13 මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |

## විදේශ විනිමය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 20 | - | අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) හිමියන් හට එම ගිණුම්වල පවත්නා මුදල් ඕනෑම අරමුණක් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීමට ඉඩ සලසමින් එකී ගිණුම් සම්බන්ධයෙන් නව විධානයන් බලයලත් වෙළඳුන් හට නිකුත් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට එ.ජ. ඩොලර් 10,000 ක් හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් හෝ ඊට සමාන ප්‍රමාණයක් තමා සන්තකයේ රඳවා ගැනීමට අවසර ලබා දෙමින් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු හට ඕනෑම ගෙවීමක් කිරීමට NRFC, RFC, RNNFC හා FEEA ගිණුම් හිමියන් හට ඉඩ ලබා දෙමින් විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| 2016 මාර්තු 11 | - | NRFC, RFC, RNNFC හා FEEA ගිණුම් හිමියන්, බලයලත් වෙළඳුන්, බලපත්‍රලාභී විශේෂිත බැංකු, විදේශ ව්‍යවහාර මුදලින් තැන්පතු භාර ගැනීම සඳහා අවසර ලබා දී ඇති බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ ද්විත්ව පුරවැසිභාවයක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් හට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා අවසර ලබා දෙමින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| 2016 මාර්තු 23 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කර ගැනීම, රඳවා ගැනීම හා පැවරීම සඳහා සහ බලයලත් වෙළෙන්දෙකුගෙන් එ.ජ. ඩොලර් මිලදී ගැනීම සඳහා 'ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම' හා 'බැඳුම්කරවල ආයෝජනය සඳහා වූ ඩොලර් ගිණුම' නමින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන්ට හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා නිලලත් නියෝජිතයන් වශයෙන් පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන්ට අවසර ලබා දෙමින් විධානයන් නිකුත් කරන ලදී. |
| 2016 අප්‍රේල් 01 | - | භාණ්ඩ අපනයනය කිරීමෙන් ලද ඉපැයීම් භාණ්ඩ අපනයනය කිරීමේ දින සිට දින 90 ක් ඇතුළත ශ්‍රී ලංකාවට ගෙන ආ යුතු බව භාණ්ඩ අපනයනකරුවන්ට දන්වන ලද අතර 1993 මාර්තු 26 දිනැති අංක 759/15 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රදානය කරන ලද නිදහස් කිරීම අවලංගු කරන ලදී. තවද, ශ්‍රී ලංකාවෙන් පිටත රඳවා තිබූ එවැනි ඕනෑම ඉපැයීමක් 2016 මැයි 01 දිනට පෙර ශ්‍රී ලංකාවට රැගෙන එන ලෙස භාණ්ඩ අපනයනකරුවන් හට දන්වන ලදී. |

2016 අප්‍රේල් 19 - රාජ්‍ය දූත සේවය මගින් රැස්කරන ලද වීසා ගාස්තු හා රාජ්‍ය දූත සේවයේ නියුතු පුද්ගලයන් සතුව පැවති වාහන විකිණීමෙන් ලද මුදල් විනිමය පාලකවරයාට යොමු කිරීමෙන් තොරව ප්‍රේෂණය කිරීමට සහ රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය දූත රුපියල් ගිණුම්වල පවත්නා අරමුදල්, සුරැකුම්පත් ආයෝජන ගිණුම (SIA) හරහා ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කිරීමට අවසර දෙමින් එම ගිණුම් සම්බන්ධයෙන් විධානයන් බලයලත් වෙළඳුන් හට නිකුත් කරන ලදී.

2016 මැයි 16 - 2013 ජුනි 12 දිනට පෙර වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත සංක්‍රමණය වූ විගමනිකයන් විසින් 2013 ජුනි 12 දිනට පසු ශ්‍රී ලංකාව තුළ දී ලද අර්ථසාධක අරමුදල් හා පාරිතෝෂික දීමනා ඇතුළු විශ්‍රාමික ප්‍රතිලාභ ද, පොලී, ලාභාංශ, විශ්‍රාම වැටුප්, කුලී ආදායම්, බදු කුලී හා ලාභ ඇතුළු වර්තන ආදායම් ද තම සංක්‍රමණික දීමනාවෙන් අඩු කිරීමකින් තොරව තම අනේවාසික ආවෘත ගිණුම් හරහා ප්‍රේෂණය කිරීමට අවසර ලබා දෙන ලදී.

- 2013 ජුනි 12 දිනට පසුව වෙනත් රටක ස්ථිර නේවාසික වීසා ලබාගත් ශ්‍රී ලාංකිකයින් හට සිය සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාව ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම පිණිස SIA ගිණුමකට මාරු කිරීමට අවසර ලබා දෙමින් විගාමිකයන් හට විදේශ විනිමය විකිණීම පිළිබඳ නව විධානයන් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලදී.

2016 ජුනි 07 - බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම්වලට විදේශීය මූලාශ්‍රයන්ගෙන් ණය ලබා ගැනීම පිණිස නව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ නමින් 'විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්' විවෘත කර පවත්වාගෙන යෑම සඳහා අවසර ලබා දෙමින් බලයලත් වෙළඳුන් හට විධානයන් නිකුත් කරන ලදී.

2016 ජුනි 10 - මුදල් ණයට දීම සහ ආරක්ෂක කළමනාකරණය, තක්සේරුකරණය හා තනි පුද්ගලයින්ට හෝ පෞද්ගලික ආයතනයන්ට උපදේශන සැපයීම ඇතුළු ආරක්ෂක සේවා සැපයීම යන ක්ෂේත්‍රයන්හි සිදු කරනු ලබන විදේශ ආයෝජන මත පනවා තිබූ සීමාකිරීම් ඉවත් කරන ලදී.

2016 සැප්තැම්බර් 29 - භාණ්ඩ අපනයනය වෙනුවෙන් ලැබෙන ආදායම්, ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු බවට ලබා දී තිබූ කාලය භාණ්ඩ අපනයනය කිරීමේ දින සිට දින 120 ක් දක්වා දීර්ඝ කරන ලදී. මෙම නියෝගය උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පෙර දින 30 ක සහන කාලයක් ලබා දීම ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු කළ හැකිය.

## මිල සංශෝධන

2016 පෙබරවාරි 01 - දේශීය දුරකථන ඇමතුම් සහ කෙටි පණිවුඩ/බහුමාධ්‍ය පණිවුඩ සඳහා වන පොදු අවම මිල පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | | මිනිත්තුවකට අවම මිල (රුපියල්) | |
|---|---|---|---|
| | | පැවති | නව |
| දේශීය ඇමතුම් (මිනිත්තු පදනම් කරගත් ගෙවීම්) | ජාලය තුළ | 1.00 | 1.50 |
| | ජාල අතර | 2.00 | 1.50 |
| දේශීය ඇමතුම් (තත්පර පදනම් කරගත් ගෙවීම්) | ජාලය තුළ | 1.25 | 1.80 |
| | ජාල අතර | 2.50 | 1.80 |
| කෙටි පණිවුඩ/බහුමාධ්‍ය පණිවුඩ (පණිවුඩයකට) | ජාලය තුළ | 0.10 | 0.20 |
| | ජාල අතර | 0.25 | 0.20 |

2016 ජූලි 14 - පහත සඳහන් අයිතම සඳහා උපරිම සිල්ලර මිල සීමාවන් පනවන ලදී.

- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 169
- වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 495
- වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 410
- කඩල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 260
- මුං ඇට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 220
- ටින් මාළු (ආනයනික) ශුද්ධ බර ග්‍රෑම් 425 ක් හෝ දියර රහිත බර ග්‍රෑම් 280 ක් සඳහා රුපියල් 140 සහ ශුද්ධ බර ග්‍රෑම් 155 ක් හෝ දියර රහිත බර ග්‍රෑම් 105 ක් සඳහා රුපියල් 70
- සුදු සීනි කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 95

| | | |
|---|---|---|
| | | - තිරිඟු පිටි කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 87 |
| | | - සම්පූර්ණ යොදය සහිත කිරි පිටි (ආනයනික) ග්‍රෑම් 400 ක් සඳහා රුපියල් 325 සහ කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 810 |
| | | - සම්පූර්ණ යොදය සහිත කිරි පිටි (දේශීය) ග්‍රෑම් 400 ක් සඳහා රුපියල් 295 සහ කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 735 |
| | | - අධි ශීත කළ හෝ ශීත කළ බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා) සම සහිතව කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 410 සහ සම රහිතව කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 495 |
| | | - අර්තාපල් (ආනයනික) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 120 |
| | | - බොම්බයි ළූනු (ආනයනික) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 78 |
| | | - නොඇඹරූ හෝ කුඩු නොකළ වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 385 |
| | | - කට්ටා කරවල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 1,100 |
| | | - සාලයා කරවල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 425 |
| | | - සස්ටජන් ග්‍රෑම් 400 සඳහා රුපියල් 1,500 |
| | | - උම්බලකඩ කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 1,500 |
| 2016 අගෝස්තු 01 | - | මගී බස් ගාස්තු සියයට 6 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. අවම බස් ගාස්තුව රුපියල් 8 සිට රුපියල් 9 දක්වා වැඩි කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 21 | - | තෝරාගත් ඖෂධීය නිෂ්පාදන 48 ක් වෙනුවෙන් උපරිම සිල්ලර මිල සීමා පැනවීම සඳහා 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී (මිල ඉහළ සීමා) නියෝගය නිකුත් කරන ලදී. |
| 2016 නොවැම්බර් 29 | - | කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,321 දක්වා රුපියල් 25 කින් අඩු කරන ලදී. |
| 2017 ජනවාරි 09 | - | භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 44 දක්වා රුපියල් 5 කින් අඩු කරන ලදී. |
| 2017 ජනවාරි 27 | - | පහත සඳහන් අයිතම සඳහා වූ උපරිම සිල්ලර මිල සීමාවන් සංශෝධනය කරන ලදී. |
| | | - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 159 |
| | | - වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 490 |
| | | - වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 405 |
| | | - මුං ඇට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 205 |
| | | - සුදු සීනි කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 93 |
| | | - අර්තාපල් (ආනයනික) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 115 |
| 2017 පෙබරවාරි 08 | - | සහල් සඳහා පහත සඳහන් උපරිම සිල්ලර මිල සීමාවන් පනවන ලදී. |
| | | - සම්බා සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 80 |
| | | - නාඩු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 72 |
| | | - කැකුළු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 70 |
| 2017 පෙබරවාරි 17 | - | සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමාවන් පහත පරිදි සංශෝධනය කරන ලදී. |

| සහල් වර්ගය | දේශීයව නිපදවන සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) | ආනයනික සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) |
|---|---|---|
| සම්බා සහල් (කීරි සහ සුදුරු සම්බා හැර) | 90 | 80 |
| නාඩු සහල් | 80 | 72 |
| කැකුළු සහල් | 78 | 70 |

| | | |
|---|---|---|
| | - | වෛද්‍ය උපකරණ සඳහා උපරිම සිල්ලර මිල සීමාවන් පැනවීම සඳහා 2017 අංක 01 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝගය නිකුත් කරන ලදී. |
| 2017 මාර්තු 14 | - | සුදු සීනි සහ අධි ශීත කළ හෝ ශීත කළ සම සහිත හා සම රහිත බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා) මත වූ උපරිම සිල්ලර මිල සීමාවන් ඉවත් කරන ලදී. |

## බදු සංශෝධන

### පුද්ගල ආදායම් බදු

අපේක්ෂිත - පුද්ගල ආදායම් බදු අනුප්‍රමාණ ව්‍යුහය පහත පරිදි සංශෝධනය කිරීම

- සේවා නියුක්තියෙන් ලබන ලාභ සහ ආදායම්

(අ) සේවා නියුක්තිකයන් සඳහා වාර්ෂික බදු නිදහස් දීමනාව රුපියල් 750,000/- සිට රුපියල් මිලියන 1.2 ක් දක්වා වැඩි කිරීම[2]

(ආ) දෙවන සේවා නියුක්තියෙහි යෙදෙන අවස්ථාවක අදාළ වන බදු අනුප්‍රමාණ පහත පරිදි සංශෝධනය කිරීම

- ගෙවීම මසකට රුපියල් 50,000 ක් නොඉක්මවන්නේ නම් සියයට 10
- ගෙවීම මසකට රුපියල් 50,000 ක් ඉක්මවන්නේ නම් සියයට 20

- අනුක්‍රමික බදු අනුප්‍රමාණ සියයට 4 සිට සියයට 24 දක්වා එක් එක් බණ්ඩයක් සඳහා රුපියල් 600,000 ක සමාන බදු බණ්ඩ ලෙස සංශෝධනය කිරීම

- පහත සඳහන් සේවා නියුක්තියෙන් ලබන ලාභ සහ ආදායම් මත වන නිදහස් කිරීම් ඉවත් කිරීම
  - ප්‍රවාහන පහසුකම්
  - විශේෂ කාණ්ඩ යටතට ගැනෙන රාජ්‍ය සේවා නියුක්තිකයන්ට ලබා දෙන ඇතැම් විශේෂිත දීමනා

### සංස්ථාපිත ආදායම් බදු

අපේක්ෂිත - ආදායම් බදු පහත පරිදි සංශෝධනය කිරීම

- සමාගම් බදු සියයට 14 ක අඩු බදු අනුප්‍රමාණය, සියයට 28 ක සම්මත බදු අනුප්‍රමාණය සහ සියයට 40 ක ඉහළ බදු අනුප්‍රමාණය ලෙස බදු අනුප්‍රමාණ 3 කට පහත පරිදි සංශෝධනය කිරීම

(අ) සියයට 14 ක අඩු බදු අනුප්‍රමාණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර,[3] භාණ්ඩ හා සේවා අපනයන, කෘෂිකාර්මික ව්‍යවසාය සහ අධ්‍යාපන සේවාවලින් ලද ලාභ සහ ආදායම් මත අදාළ වේ.

(ආ) ඉහළ බදු අනුප්‍රමාණය වන සියයට 40, ඔට්ටු හා සූදු, මත්පැන්, දුම්කොළවලින් ලද ලාභ සහ ආදායම් සඳහා අදාළ වේ.

(ඇ) සම්මත බදු අනුප්‍රමාණය වන සියයට 28, බැංකු හා මූල්‍ය ව්‍යාපාර, රක්ෂණ, කල්බදු සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළුව අනෙකුත් සියලුම අංශවල ලාභ සහ ආදායම් මත අය කෙරේ.

- අරමුදල් (සේවක අර්ථ සාධක, සේවක භාරකාර වැනි) පුණ්‍යායතන, ලාභාංශ, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ අනෙකුත් සියලුම අංශයන්හි ලාභ සහ ආදායම් මත අය කරනු ලබන බදු අනුප්‍රමාණය සියයට 10 සිට සියයට 14 දක්වා වැඩි කිරීම

- පහත අයිතම මත වන ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම
  - ඇතැම් ලාභාංශ සහ ලැයිස්තුගත සුරැකුම්පත් (සාංගමික ණය සුරැකුම්පත් වැනි) සහ වෙනත් සාධන පත්‍ර මත ආයෝජනයන්ගෙන් ලබන පොලී හෝ ලාභ
  - ඒකක භාරයක හෝ අන්‍යෝන්‍ය අරමුදලක ආයෝජනය කරනු ලබන ඒකක දරන්නෙකුට දැනට පවත්නා ආදායම් බදු නිදහස, සංස්ථාපිත අංශය සඳහා ඉවත් කිරීම
  - ඉතිරිකිරීම් ගිණුම් මත ලබන පොලිය සඳහා මසකට රුපියල් 5,000 දක්වා
  - ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බැංකු තැන්පතු මත ලබන පොලිය සඳහා දැනට පවතින බදු නිදහස වසරකට රුපියල් මිලියන 1.5 ක සීමාවකට යටත් කිරීම

- ඕනෑම වෙළඳාමක හෝ ව්‍යාපාරයක ආදායම් බද්ද සඳහා පහත සඳහන් ආයෝජන බදු සහන ලබා දීම
  - එ.ජ. ඩොලර් මිලියන 3 කට නොඅඩු ස්ථාවර වත්කම් මත කරනු ලබන ආයෝජනයක් සහිත අවම වශයෙන් සේවා නියුක්තිකයන් 250 කට රැකියා අවස්ථා බිහි කරන ව්‍යාපාරයක එම ආයෝජන මත සියයට 100 ක ප්‍රාග්ධන දීමනාවක් ලබා දීම

2 සුදුසුකම් ලබන ගෙවීම සඳහා වන අඩු කිරීම ඒ අනුව සංශෝධනය වේ.

3 මෙම කාර්යය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, වසරකට උපරිම පිරිවැටුම් සීමාව රු. මිලියන 500 ක් ලෙස විශේෂිත නිර්ණායකයක් යටතේ නිර්වචනය කෙරේ.

- ඉහත සඳහන් වන කොන්දේසි යටතේ උතුරු පළාතේ කරනු ලබන ආයෝජනයන් මත සියයට 200 ක ප්‍රාග්ධන දීමනාවක් ලබා දීම
- එ.ජ. ඩොලර් මිලියන 5 කට නොඅඩු ස්ථාවර වත්කම් මත කරනු ලබන ආයෝජනයක් සහිත අවම වශයෙන් සේවා නියුක්තිකයන් 300 කට රැකියා අවස්ථා ඇති කරවන ආයෝජන සඳහා එම ආයෝජන වටිනාකමින් සියයට 100 ක ප්‍රාග්ධන දීමනාවක් සහ ව්‍යාපාර කටයුතු ආරම්භ කර දෙවන වර්ෂයේ දී ආයෝජන වටිනාකමින් සියයට 5 ක බදු බැරක් ලබා දීම

- ඕනෑම වෙළඳාමක හෝ ව්‍යාපාරයක ආදායම් බද්ද සඳහා පහත සඳහන් විශේෂිත බදු සහන ලබා දීම
  - එ.ජ. ඩොලර් මිලියන 100 කට නොඅඩු ආයෝජනයක් සහිත අවම වශයෙන් සේවා නියුක්තිකයන් 500 කට රැකියා අවස්ථා ඇති කරවන අවස්ථාවක හෝ
  - එ.ජ. ඩොලර් මිලියන 500 කට නොඅඩු ආයෝජනයක් කරනු ලබන අවස්ථාවක
- විදේශ මුදලින් ලබන අපනයන මත වන ලාභ 2015/16 තක්සේරු වර්ෂයට සාපේක්ෂව 2016/17 තක්සේරු වර්ෂය තුළ සියයට 15 කින් හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් වැඩි වන අවස්ථාවක, එම වැඩි වන ලාභය මත 2016/17 වර්ෂය සඳහා ගෙවන ආදායම් බද්දෙන් සියයට 75 ක් ප්‍රතිදානයක් ලෙස ලබා දීම
- ප්‍රාග්ධන දීමනා ප්‍රතිශතයන් පහත පරිදි සංශෝධනය කිරීම
  - පිරියත, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ඒ හා සමාන අයිතම සඳහා සියයට 33 1/3, සියයට 50 සහ සියයට 100 සිට සියයට 20 දක්වා (සමාන වාරිකයන් 5 ක්)
  - ගොඩනැගිලි සඳහා සියයට 10 සිට සියයට 5 දක්වා (සමාන වාරිකයන් 20 ක්)

**රඳවා ගැනීමේ බදු**

අපේක්ෂිත

- පොලිය මත රඳවා ගැනීමේ බද්ද සියයට 5 දක්වා වැඩි කිරීම
- මසකට රුපියල් 50,000 ක් ඉක්මවන නිශ්චිත ගාස්තු සඳහා රඳවා ගැනීමේ බද්දක් හඳුන්වා දීම
- මතිමාත්‍ර බදු බැර ඉවත් කරනු ලබන අතර, නිකුත් කරන අවස්ථාවේ දී රඳවා ගැනීමේ බද්දට යටත් වන භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර හෝ සාංගමික ණය සුරැකුම්පත් මත ලබා දෙන ශුද්ධ පොලිය ආදායම් බද්දට යටත් කිරීම

**කාල කඩඉම**

අපේක්ෂිත

- තක්සේරු සහ අභියාචනා සඳහා වන කාල කඩඉම සම්බන්ධ විධිවිධාන පහත පරිදි සංශෝධනය කිරීම
  - තක්සේරුවක් නිකුත් කිරීම සඳහා මාස 18 සිට මාස 09 දක්වා
  - කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචනයක් විසඳීමට මාස 24 සිට මාස 06 දක්වා
  - බදු අභියාචනා කොමිසම වෙත කරනු ලබන අභියාචනයක් විසඳීමට මාස 24 සිට මාස 06 දක්වා

**ආර්ථික සේවා ගාස්තු**

2016 අප්‍රේල් 01

- ආර්ථික සේවා ගාස්තු මත පහත සඳහන් සංශෝධන සිදු කරන ලදී.
  - ලාභ උපයන ව්‍යාපාර සඳහා ලබා දී තිබූ නිදහස් කිරීම ඉවත් කරන ලදී.
  - වර්ෂයක් සඳහා ගෙවිය යුතු බදු ප්‍රමාණයෙහි උපරිම සීමාව වූ රුපියල් මිලියන 120 ඉවත් කරන ලදී.
  - ආර්ථික සේවා ගාස්තු අනුපාතිකය සියයට 0.25 සිට සියයට 0.5 දක්වා ඉහළ නංවන ලදී.
  - 2016 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවිය යුතු ආදායම් බද්දක් වෙනුවෙන් ඉදිරියට ගෙන එන ලද ආර්ථික සේවා ගාස්තු අඩු කළ හැකි කාලසීමාව අවුරුදු 5 සිට අවුරුදු 3 දක්වා අඩු කරන ලදී.
  - සමස්ත පිරිවැටුම කාර්තුවක් සඳහා රුපියල් මිලියන 50 ඉක්මවන අවස්ථාවන්හි දී පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් සිල්ලර වෙළඳාම ආර්ථික සේවා ගාස්තුවට යටත් කරන ලදී. ගෙවිය යුතු බදු ප්‍රමාණය එවැනි වෙළඳාමක පිරිවැටුමෙන් 1/10 ක් ලෙස ගණනය කෙරේ.

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 50 සිට කාර්තුවකට රුපියල් මිලියන 12.5 දක්වා අඩු කිරීම |
| | - | රත්‍රන්, වෙනත් වටිනා ලෝහ සහ මොටර් වාහන ආනයනය මත ආර්ථික සේවා ගාස්තු පැනවීම |

**එකතු කළ අගය මත බදු**

| | | |
|---|---|---|
| 2016 මැයි 02[4] | - | එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී. |
| | - | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී. |
| | - | විදුලි සංදේශ සේවා සැපයීම, විදුලි සංදේශ කර්මාන්තය සඳහා යන්ත්‍ර හෝ උපකරණ, තඹ කම්බි රැහැන් ඇතුළු අධිතාක්ෂණික උපකරණ ආනයනය හෝ සැපයීම, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවා සහ සෞඛ්‍යාරක්ෂක සේවා එකතු කළ අගය මත බද්දට යටත් කරන ලදී. |
| | - | තොග සහ සිල්ලර වෙළඳාම මත එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු විකුණුම් වටිනාකම කාර්තුවකට රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී (ක්‍රියාත්මක නොවීය). |
| 2016 නොවැම්බර් 01 | - | එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී. |
| | - | තොග සහ සිල්ලර වෙළඳාම මත එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු විකුණුම් වටිනාකම කාර්තුවකට රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 12.5 දක්වා අඩු කරන ලදී. |
| | - | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී. |
| | - | විදුලි සංදේශ සේවා සැපයීම, විදුලි සංදේශ කර්මාන්තය සඳහා යන්ත්‍ර හෝ උපකරණ, තඹ කම්බි රැහැන් ඇතුළු අධිතාක්ෂණික උපකරණ ආනයනය හෝ සැපයීම, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවා සහ සෞඛ්‍යාරක්ෂක සේවා (වෛද්‍ය වෘත්තිකයන්, වෛද්‍ය උපදේශන සේවා, චැනල් ගාස්තු සහ රෝහල් කාමර ගාස්තු, සම්බන්ධ පිරිවැය හැර) එකතු කළ අගය මත බද්දට යටත් කරන ලදී. |
| | - | පහත සඳහන් ද්‍රව්‍ය ආනයනය කිරීම හෝ සැපයීම මත එකතු කළ අගය මත බදු පනවන ලදී.<br>- සිගරැට්<br>- මත්පැන්<br>- සැහැල්ලු විදුලි හෝ විද්‍යුත් භාණ්ඩ<br>- සුවඳ විලවුන්<br>- ගල්අඟුරු<br>- විදුලි සංදේශ කර්මාන්තය සඳහා වන උපකරණ |
| 2016 නොවැම්බර් 11 | - | පහත දැක්වෙන සැපයුම් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.<br>- ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනා ගත් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා වන පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපාංග<br>- ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනා ගත් විදුලි භාණ්ඩ<br>- පුවත්පත් හැර ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනා ගත් සඟරා, ජර්නල්, වාර සඟරා ආදිය<br>- සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8421.29.10 යටතේ හඳුනා ගත් වෛද්‍ය උපකරණ |
| අපේක්ෂිත | - | දින 30 කට නොවැඩි කාලයක් ලංකාවේ රැඳී සිටින විදේශිකයන් විසින් මිල දී ගනු ලබන භාණ්ඩ මත වන එකතු කළ අගය මත බද්ද, ඔවුන් ලංකාවෙන් පිටවන අවස්ථාවේ දී ආපසු ගෙවීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම |

4 2016 නොවැම්බර් 01 දින නීතිගත කරන ලද 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු පනත අනුව මෙම ක්‍රියාමාර්ග වලංගු වන්නේ 2016 මැයි 02 දින සිට 2016 ජූලි 11 දක්වා කාලසීමාව සඳහා පමණි.

| | |
|---|---|
| | - බාහිර පිවිසුම් ක්‍රියාකරුවන් විසින් දේශීය ක්‍රියාකරුවන් වෙත සපයනු ලබන ජාත්‍යන්තර විදුලි සංදේශ සේවාවන් සඳහා එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ලබා දීම<br>- සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය (SVAT) ඉවත් කිරීම |

**ජාතිය ගොඩනැගීමේ බද්ද**

| | |
|---|---|
| 2016 මැයි 02[5] | - ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී.<br>- විදුලි සංදේශ සේවා සැපයීම, විදුලි බලය සැපයීම, ලිහිසි තෙල්, නිවාස ව්‍යාපෘති හැර වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ ලබා දී තිබූ බදු නිදහස් කිරීම ඉවත් කරන ලදී. |
| 2016 නොවැම්බර් 01 | - ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී.<br>- විදුලි සංදේශ සේවා සැපයීම, විදුලිබලය සැපයීම, ලිහිසි තෙල්, නිවාස ව්‍යාපෘති හැර වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ ලබා දී තිබූ බදු නිදහස් කිරීම ඉවත් කරන ලදී. |
| 2016 නොවැම්බර් 11 | - පහත සඳහන් අයිතම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.<br>  - පුවත්පත් හැර ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනා ගත් මුද්‍රිත පොත්, සඟරා, ජර්නල්, වාර සඟරා ආදිය<br>  - ඇතැම් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනා ගත් සූර්ය කෝෂ පැනල සහ උපාංග |

**නිෂ්පාදන බදු/සුරා බදු**

| | |
|---|---|
| 2016 ජනවාරි 01 | - බෝතල් කරන ලද රා සඳහා අය කළ සුරා බද්ද ලීටරයට රුපියල් 10 සිට ලීටරයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| 2016 අප්‍රේල් 01 | - ඊතයිල් මද්‍යසාර ආනයනය සහ දේශීය සැපයුම මත පනවා තිබූ සුරා බදු වැඩි කරන ලදී. |
| 2016 සැප්තැම්බර් 01 | - විදේශීය මත්පැන් ආනයනය සඳහා නිෂ්පාදන බද්ද පහත පරිදි පනවන ලදී.<br>  - ධාන්‍ය මත්පැන් තොග ලීටරයක් සඳහා රුපියල් 50<br>  - විදේශ වයින් තොග ලීටරයක් සඳහා රුපියල් 100<br>  - අනෙකුත් විදේශීය මත්පැන් තොග ලීටරයක් සඳහා රුපියල් 200 |
| 2017 ජනවාරි 01 | - බෝතල් කරන ලද රා සඳහා අය කළ බද්ද ලීටරයට රුපියල් 30 සිට ලීටරයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| අපේක්ෂිත | - ආනයනය කරන ලද පානීය නොවන මද්‍යසාර මත ලීටරයකට රුපියල් 25 ක සුරා බද්දක් හඳුන්වා දීම<br>- එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය මත සුරා බද්දක් පැනවීම |

**නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද**

| | |
|---|---|
| 2016 මැයි 27 | - මෝටර් වාහන ආනයනය කිරීමේ දී අය කළ ඒකක නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු අනුපාතිකය සංශෝධනය කරන ලදී. |
| 2016 අගෝස්තු 20 | - ඩීසල් සඳහා වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ලීටරයට රුපියල් 3 සිට ලීටරයට රුපියල් 13 දක්වා වැඩි කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 04 | - සිගරට් සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ඉහළ නංවන ලදී. |
| 2016 නොවැම්බර් 11 | - බීර කෑන් මත පහත පරිදි නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දක් පනවන ලදී.<br>  - මිලි ලීටර් 350 ට නොවැඩි කෑන් එකක් සඳහා රුපියල් 10<br>  - මිලි ලීටර් 350 ට වැඩි කෑන් එකක් සඳහා රුපියල් 15 |

5 2016 නොවැම්බර් 07 දින නීතිගත කරන ලද 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව මෙම ක්‍රියාමාර්ග වලංගු වන්නේ 2016 මැයි 02 දින සිට 2016 ජූලි 11 දක්වා කාලසීමාව සඳහා පමණි.

**ආනයන තීරු බදු**

| | | |
|---|---|---|
| 2016 පෙබරවාරි 01 | - | සහල් ආනයනය සඳහා අය කළ ආනයන තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| 2016 පෙබරවාරි 09 | - | තිරිඟු ඇට ආනයනය කිරීමේ දී ලබා දී තිබූ සියයට 15 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 4 ක් දක්වා අඩු කරන ලදී. ඒ අනුව, තිරිඟු ඇට ආනයනය සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 6 කි. |
| 2016 ජූනි 23 | - | ඩීසල් ආනයනයේ දී ලබා දී තිබූ ලීටරයට රුපියල් 6 ක් වූ තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 15 කි. |
| 2016 ජූලි 15 | - | කිරිපිටි ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 90 ක් වූ තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව කිරිපිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 135 කි. |
| 2016 අගෝස්තු 13 | - | පොලිප්‍රොපිලීන් බෑග් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 15 ක තීරු බද්දක් පනවන ලදී. |
| 2016 අගෝස්තු 25 | - | ඊතයිල් මද්‍යසාර ආනයන සඳහා අය කළ තීරු බද්ද ලීටරයට රුපියල් 400 සිට ලීටරයට රුපියල් 500 දක්වා වැඩි කරන ලදී. |
| 2016 සැප්තැම්බර් 15 | - | තිරිඟු ඇට ආනයනය කිරීමේ දී පැවති රුපියල් 4 ක තීරු බදු අත්හැරීම ඉවත් කරන ලද අතර ආනයන බද්ද සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 12 දක්වා වැඩි කරන ලදී. |
| 2016 නොවැම්බර් 11 | - | කිරිපිටි ආනයනය සඳහා ලබා දී තිබූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 90 සිට කිලෝග්‍රෑමයට රුපියල් 125 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 100 කි. |
| | - | සහල් ආනයනය සඳහා අය කළ ආනයන තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට සියයට 30 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 50 ලෙස සංශෝධනය කරන ලදී. |
| 2016 දෙසැම්බර් 10 | - | තිරිඟු ඇට ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 3 ක තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව තිරිඟු ඇට ආනයනය සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 9 කි. |
| 2016 දෙසැම්බර් 20 | - | කිරිපිටි ආනයනය සඳහා ලබා දී තිබූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 125 සිට කිලෝග්‍රෑමයට රුපියල් 180 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 45 කි. |
| 2017 පෙබරවාරි 01 | - | ඩීසල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 3 ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 12 කි. |
| | - | පෙට්‍රල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 10 ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව පෙට්‍රල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 25 කි. |

**ආනයන වටිනාකම**

| | | |
|---|---|---|
| 2016 මාර්තු 01 | - | නිෂ්පාදකයා විසින් ප්‍රකාශිත මිල පදනම් කරගෙන, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් වාහනයක ආනයන වටිනාකම තීරණය කිරීම වෙනුවට, මෝටර් වාහනවල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා 2016 මාර්තු 01 දින නිකුත් කරන ලද ගැසට් පත්‍ර අංක 1956/17 (i අයිතමය) හි සඳහන් පරිදි පහත විකල්ප අතුරින් වටිනාකමින් වැඩි අගය සලකා බලනු ලැබේ.<br>(අ) නිෂ්පාදකයා විසින් ප්‍රකාශිත මිල පදනම් කරගෙන, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වටිනාකම<br>(ආ) ඉන්වොයිස් කරන ලද නැව තෙක් නොමිලේ (FOB) වාහනයේ වටිනාකම |

| | | |
|---|---|---|
| 2016 මැයි 26 | - | මෝටර් වාහනවල ආනයන වටිනාකම ගණනය කිරීම සඳහා 2016 මාර්තු 01 දින නිකුත් කරන ලද අංක 1956/17 දරන ගැසට් පත්‍රය (අයිතම අංක (i)), 2016 මැයි 25 දින නිකුත් කරන ලද ගැසට් පත්‍ර අංක 1968/11 මගින් පහත ආකාරයට සංශෝධනය කරන ලදී.<br>(අ) අලුත්ම වාහනයක් සඳහා ගනුදෙනු වටිනාකම එකී වාහනයේ නිෂ්පාදකයා විසින් නිකුත් කරන ලද හෝ නිෂ්පාදකයා විසින් සහතික කරන ලද ඉන්වොයිසියක් මගින් තහවුරු කළ යුතුය.<br>(ආ) අනෙකුත් මෝටර් රථ සඳහා ගනුදෙනු වටිනාකම එම වර්ගයේ හෝ ඊට සැම අතින්ම සමාන අලුත්ම වාහනයක වටිනාකමින් සියයට 82.5 කට වඩා නොඅඩු විය යුතුය. |
| 2016 ජුනි 14 | - | මෝටර් වාහනවල ආනයන වටිනාකම ගණනය කිරීම සඳහා 2016 මැයි 25 දින නිකුත් කරන ලද අංක 1968/11 දරන ගැසට් පත්‍රය (අයිතම අංක (i) (ආ)), 2016 ජුනි මස 14 දින නිකුත් කරන ලද ගැසට් පත්‍ර අංක 1971/10 මගින් පහත ආකාරයට සංශෝධනය කරන ලදී.<br>අනෙකුත් මෝටර් රථ සඳහා ගනුදෙනු වටිනාකම එම වාහනය අපනයනය කරන රටෙහි එම වර්ගයේම හෝ එකී වාහනයට සැම අතින්ම සමාන අලුත්ම වාහනයක ගනුදෙනු කළ වටිනාකමින් සියයට 85 කට වඩා නොඅඩු විය යුතුය.<br>තවද, ශ්‍රී ලංකාවේ වරාය දක්වා වාහනය ළඟා වන තෙක් ගැනුම්කරු විසින් දරන ලද තැරැව් ගාස්තු සහ විකුණුම් කොමිස් (අයිතම 5) ද මෝටර් වාහනයක ආනයන වටිනාකම ගණනය කිරීම සඳහා ඇතුළත් කරන ලදී. |

**සෙස් බද්ද**

| | | |
|---|---|---|
| 2016 ජුනි 15 | - | අමු රබර් අපනයනය සඳහා වූ සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 4 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා වැඩි කරන ලදී. |
| | - | සංයෝජිත වර්ගීකරණ අංක 02.01, 02.02, 02.04, 02.06, 02.07 සහ 02.10 යටතේ මස් ආනයනය සඳහා වූ සෙස් බද්ද සියයට 30 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 225 සිට සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 100 දක්වා අඩු කරන ලදී. |
| 2016 අගෝස්තු 24 | - | බීඩි කොළ ආනයනය සඳහා අය කළ සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 350 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2,000 දක්වා වැඩි කරන ලදී. |

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 21 | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි බීජ, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 ජනවාරි 29 | - | ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ සියයට 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 පෙබරවාරි 29 දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 175 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 අප්‍රේල් 28 දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 මාර්තු 01 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 35 දක්වා වැඩි කරන ලදී. |
| | - | බොම්බයි ළූනු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී. |
| 2016 මාර්තු 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, කුරක්කන්, මාජරින්, සීනි සහ එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 අප්‍රේල් 02 | - | කරවල, යෝගට්, වෙඬරු, කිරිවලින් නිපදවූ තැවරුම්, රතු ළූනු, සුදු ළූනු, අලුත් දොඩම්, මිදි, ඇපල්, සූදුරු බීජ, මහදුරු බීජ, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | |
|---|---|
| 2016 මැයි 13 | - එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් වැඩි කරන ලදී.<br>- මේද ප්‍රතිශතය සියයට 80 ක් හෝ ඊට වැඩි මාජරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 175 සිට කිලෝග්‍රෑමයට රුපියල් 195 දක්වා වැඩි කරන ලදී.<br>- මාජරින් (අනෙකුත්) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 275 සිට කිලෝග්‍රෑමයට රුපියල් 295 දක්වා වැඩි කරන ලදී. |
| 2016 මැයි 21 | - අලුත්, ශීත කළ හෝ අධිශීත කළ මසුන්, මයිසූර් පරිප්පු (රතු පරිප්පු), කහ පරිප්පු, රට ඉඳි සහ සූදුරු බීජ ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- රතු ළූනු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී.<br>- මහදුරු බීජ ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 52 සිට කිලෝග්‍රෑමයට රුපියල් 162 දක්වා වැඩි කරන ලදී. |
| 2016 ජූනි 17 | - එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් වැඩි කරන ලදී.<br>- මාජරින් (අනෙකුත්) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 295 සිට කිලෝග්‍රෑමයට රුපියල් 315 දක්වා වැඩි කරන ලදී.<br>- පාම් ඔලේන් ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 155 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2016 ජූලි 01 | - අර්තාපල් සහ බොම්බයි ළූනු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- ඉරිඟු සහ ඉඳල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා සියයට 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පනවන ලදී. |
| 2016 ජූලි 19 | - උම්බලකඩ, වියළි හාල්මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 0.25 දක්වා අඩු කරන ලදී. |
| 2016 අගෝස්තු 20 | - බොම්බයි ළූනු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| 2016 අගෝස්තු 25 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| 2016 සැප්තැම්බර් 08 | - මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 සැප්තැම්බර් 16 | - සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි කරන ලදී.<br>- සුදු ස්ඵටිකකෘත සීනි කිලෝග්‍රෑමයට රුපියල් 0.25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2 දක්වා<br>- අනෙකුත් සීනි කිලෝග්‍රෑමයට රුපියල් 0.25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා |

| | |
|---|---|
| 2016 සැප්තැම්බර් 30 | - රතු සහ කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි කරන ලදී.<br>- සම්පූර්ණ (පියලි නොකළ) පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 0.25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 0.25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා |
| 2016 ඔක්තෝබර් 02 | - කරවල, යෝගට්, වෙඬරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූනු, අලුත් දොඩම්, මිදි, ඇපල්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 නොවැම්බර් 08 | - ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 50 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණයේ සිට සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 75 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය දක්වා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී.<br>- මුං ඇට ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී.<br>- පහත සඳහන් වෙළඳ භාණ්ඩ ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවන ලදී.<br>- මැංගුස්ටින් (අලුත් සහ වියළි) සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 200<br>- දොඩම් (වියළි) සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 2,000<br>- පෙයාර්ස් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 175<br>- චෙරීස් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 250<br>- ප්ලම්ස් සහ ස්ලෝස් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 200<br>- කිවී ෆෲට් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 175<br>- සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0810.90.99 යටතේ වන අනෙකුත් පළතුරු (අලුත්) සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 200 |
| 2016 නොවැම්බර් 11 | - ස්ඵටිකකෘත සුදු උක් සීනි සහ බීට් සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 2 සිට කිලෝග්‍රෑමයට රුපියල් 7 දක්වා වැඩි කරන ලදී. |
| 2016 නොවැම්බර් 21 | - රතු ළූනු, රට ඉඳි, සූදුරු බීජ, මාජරින් සහ මහදුරු බීජ ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- වියළි මිදි ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 230 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පනවන ලදී. |
| 2016 දෙසැම්බර් 10 | - පාම් තෙල් (අනෙකුත්) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 170 සිට කිලෝග්‍රෑමයට රුපියල් 175 දක්වා වැඩි කරන ලදී.<br>- අනෙකුත් එළවළු තෙල් වර්ග ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2016 දෙසැම්බර් 20 | - තිරිඟු සහ ඉදල් ඉරිඟු (සෝගම්) ඇට ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි සියයට 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා සංශෝධනය කරන ලදී.<br>- ස්ඵටිකකෘත සුදු උක් සීනි සහ බීට් සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 7 සිට කිලෝග්‍රෑමයට රුපියල් 13 දක්වා වැඩි කරන ලදී. |

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 07 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 ජනවාරි 19 | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් අඩු කරන ලදී. |
| 2017 ජනවාරි 28 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| 2017 පෙබරවාරි 17 | - | අර්තාපල් සහ බොම්බයි ළූනු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | රතු සහ කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි කරන ලදී.<br>- සම්පූර්ණ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා |
| 2017 පෙබරවාරි 24 | - | එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් අඩු කරන ලදී. |
| 2017 පෙබරවාරි 27 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 30 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මාර්තු 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, කුරක්කන් සහ (ස්ඵටිකකෘත සුදු සීනි හැර) සීනි සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

**වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 01 | - | වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සියයට 5 සිට සියයට 7.5 දක්වා වැඩි කරන ලදී. |
| | - | ඉලෙක්ට්‍රොනික් සහ විද්‍යුත් අයිතම සඳහා සියයට 2.5 ක සහනදායී වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. |
| | - | ඉදිකිරීම්, කිරි නිෂ්පාදන සහ කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2016 නොවැම්බර් 11 | - | මුද්‍රිත පොත්, සඟරා, ජර්නල් සහ වාර සඟරා මත පැවති වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කරන ලදී. |
| | - | සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 3926.90.80 සහ 9602.00.10 යටතේ වන ඖෂධ නිෂ්පාදන මත වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 2.5 දක්වා අඩු කරන ලදී. |

**මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 01 | - | ණය කාඩ්පත් දේශීය වශයෙන් භාවිතා කිරීම මත සෑම රුපියල් 1,000 කට හෝ ඉන් කොටසකට පැවති රුපියල් 15 ක මුද්දර ගාස්තුව ඉවත් කරන ලදී. |
| | - | විදේශීය මිලදී ගැනීම් සඳහා ණය කාඩ්පත් භාවිතා කිරීමේ දී සෑම රුපියල් 1,000 කට හෝ ඉන් කොටසකට පැවති මුද්දර ගාස්තුව රුපියල් 25 දක්වා වැඩි කරන ලදී. |
| | - | යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක් සඳහා වන මුද්දර ගාස්තු ඉවත් කරන ලදී. |

**නැව්නැගීමේ/ගුවන්ගත වීමේ බදු**

2016 ජනවාරි 01 - නැව්නැගීමේ/ගුවන්ගත වීමේ බදු පහත පරිදි වැඩි කරන ලදී.
- ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තෙක් සඳහා එ.ජ. ඩොලර් 25 සිට එ.ජ. ඩොලර් 30 දක්වා
- නැව් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තෙක් සඳහා එ.ජ. ඩොලර් 5 සිට එ.ජ. ඩොලර් 30 දක්වා

2017 ජනවාරි 01 - නැව්නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද එ.ජ. ඩොලර් 30 සිට එ.ජ. ඩොලර් 50 දක්වා වැඩි කරන ලදී.

**ගාස්තු සහ අයකිරීම්**

2016 ජනවාරි 01 - විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා වන ගාස්තුව පහත පරිදි වැඩි කරන ලදී.

| | | පැවති ගාස්තුව (රුපියල්) | නව ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|
| විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව (එක් දින සේවය) | වැඩිහිටි | 7,500 | 10,000 |
| | ළමා | 3,500 | 5,000 |
| විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව (සාමාන්‍ය සේවය) | වැඩිහිටි | 2,500 | 3,000 |
| | ළමා | 1,500 | 2,000 |
| ද්විත්ව පුරවැසි අයදුම්පත්‍ර ගාස්තුව | | 250,000 | 300,000 |

- සාක් රටවල් සඳහා වන වීසා ගාස්තුව එ.ජ. ඩොලර් 10 සිට එ.ජ. ඩොලර් 20 දක්වා වැඩි කරන ලදී.

අපේක්ෂිත
- සමාගම් මත වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් සහ ස්වේච්ඡාවෙන් ඈවර කිරීමේ ගාස්තුවක් පැනවීම
- යම් තැනැත්තෙකු විසින් උසාවියේ නඩුවක් පැවරීමේ දී පැවරුම් ගාස්තුවක් පැනවීම
- රථ වාහන වැරදි, ස්ථානික දඩ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නැවත වර්ගීකරණය කිරීම
- කැසිනෝ සඳහා වන ප්‍රවේශ ගාස්තුව ඉවත් කිරීම
- බීඩි කොළ ආනයනකරුවන් මත රුපියල් මිලියන 5 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් පැනවීම

**අනෙකුත්**

2016 ජනවාරි 01
- ලැබෙන ඇමතුම් මත ජාත්‍යන්තර විදුලි සංදේශ නියාමන ගාස්තුව එ.ජ. ඩොලර් ශත 9 සිට එ.ජ. ඩොලර් ශත 12 දක්වා වැඩි කරන ලදී.
- වාහන හිමිකම් බද්ද හඳුන්වා දෙන ලදී.
- ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද ඉවත් කරන ලදී.
- විදේශීය මත්පැන් සිල්ලරට විකිණිය හැකි සහ ප්‍රවාහනය කළ හැකි උපරිම සීමාව ලීටර් 7.5 කට සීමා කරන ලදී.

2016 අගෝස්තු 04 - 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පහත සඳහන් කරුණු සඳහා නීතිගත කරන ලදී.
- තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම සඳහා විධිවිධාන සැපයීම
- තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම
- තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම
- තොරතුරු නිලධාරීන් පත් කිරීම

අපේක්ෂිත
- බැංකු සහ මූල්‍ය ආයතන මගින් සිදු කරන ගනුදෙනු සඳහා එම ගනුදෙනුවල මුළු අගය මත සියයට 0.05 ක මූල්‍ය ගනුදෙනු බද්දක් හඳුන්වා දීම
- රට තුළට ගෙන්වනු ලබන සහ සිංහල, දෙමළ හෝ වෙනත් භාෂාවකින් හඬ කවනු ලබන විදේශීය ටෙලි නාට්‍ය මත අදාළ වන ටෙලිනාට්‍ය බද්ද වැඩි කිරීම
- අන්තර්ජාල සේවා මත විදුලි සංදේශ ගාස්තුව සියයට 10 සිට සියයට 25 දක්වා වැඩි කිරීම
- සිම් කාඩ් මත රුපියල් 200 ක සක්‍රිය කිරීමේ ගාස්තුවක් පැනවීම

- සියලුම ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත ඔවුන්ගේ යටිතල පහසුකම්, 3G පහසුකම් සැපයීම සඳහා පරිවර්තනය කිරීමට මාස 6 ක කාලයක් ලබා දෙන අතර එම මාස 6 ක කාලය ඇතුළත 3G පහසුකම් සැපයීමට අපොහොසත් වන සේවා සපයන්නන් මත දිස්ත්‍රික්කයකට රුපියල් මිලියන 100 ක අධිභාරයක් පැනවීම
- දැනට පවතින වාර්ෂික වර්ණාවලි ගාස්තුව සියයට 25 කින් වැඩි කිරීම
- නිශ්චල දේපළ බැහැර කිරීමේ දී උපලබ්ධි වන ලාභ මත සියයට 10 ක ප්‍රාග්ධන ලාභ බද්දක් පැනවීම
- විද්‍යුත් මෝටර් රථ හා ට්‍රැක්ටර් හැර අනෙකුත් වාහන මත කාබන් බද්දක් පැනවීම
- සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද සංශෝධනය කිරීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගිනි අවි හැර අනෙකුත් ගිනි අවි මත රුපියල් 20,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් පැනවීම
- ලිහිසි තෙල්, තාර සහ රත්තරන් ආනයනය මත බලපත්‍ර ගාස්තුවක් අය කිරීම

## රාජ්‍ය වියදම

2016 පෙබරවාරි 25 - 2016 ජනවාරි 01 දින සිට අදියර පහකින් යුතු වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 නිකුත් කරන ලදී.

2016 මාර්තු 09 - වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය වෙනුවට හෙක්ටයාරයකට රුපියල් 25,000 ක මූල්‍යමය දීමනාවක් වසරකට හෙක්ටයාර දෙකක උපරිමයකට යටත්ව ගෙවීම සඳහා චක්‍රලේඛ අංක 2016 NFS/FCG(1) නිකුත් කරන ලදී.

2016 මැයි 01 - 2016 ජනවාරි 01 දිනට පසුව විශ්‍රාම යන නිලධාරීන් සඳහා "අග්‍රහාර රැකවරණය" නමින් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා විශ්‍රාම චක්‍රලේඛ අංක 04/2016 නිකුත් කරන ලදී.

2016 මැයි 03 - තේ, පොල් සහ රබර් සඳහා පොහොර සහනාධාරය වෙනුවට වසරක් සඳහා, පිළිවෙළින්, හෙක්ටයාරයකට රුපියල් 15,000, රුපියල් 9,000 සහ රුපියල් 5,000 ක් වූ මූල්‍යමය දීමනාවක් ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

## රාජ්‍ය ණය කළමනාකරණය

2016 ජනවාරි 07 - 2016 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 2,500 ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2016 පෙබරවාරි 16 - 'ලංකාසෙකියු, මධ්‍යම තැන්පතු පද්ධතියේ රජයේ සුරැකුම්පත්වල හිමිකාරිත්වය සටහන් කිරීම' පිළිබඳ චක්‍රලේඛය නිකුත් කිරීම මගින්, 2013 අගෝස්තු 01 වන දින නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධතියට අදාළ නීතිරීතීන්ට (වෙළුම 2.1) අනුකූලව සියලු සහභාගීත්ව ආයතනයන්හි ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදු කරන ලෙස නියම කරන ලදී.

2016 මාර්තු 13 - ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කළ හැකි අවම සීමාව එ.ජ. ඩොලර් 100,000 සිට එ.ජ. ඩොලර් 10,000 දක්වා අඩු කරන ලදී.

2016 අප්‍රේල් 07 - දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත අනුව හා අනෙකුත් විධිවිධානයන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී/ලේඛකාධිකාරී විසින් සිදු කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් හා අනෙකුත් සහභාගිවන්නන් පිළිබඳ සුපරීක්ෂණ හා නියාමන කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත පවරන ලදී.

2016 අගෝස්තු 01 - ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කරන ලද බ්ලූම්බර්ග් (Bloomberg) වෙළඳ පද්ධතිය (ස්ථාවර ආදායම් මිල ගණන් දැක්වීමේ පිටුව) සියලුම ප්‍රාථමික අලෙවිකරුවන්ට පහත සඳහන් කර්තව්‍යයන් සඳහා යොදා ගැනීමට නියම කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- ප්‍රාථමික අලෙවිකරුවන් අතර සිදු කරනු ලබන සියලුම හිමිකම් පැවරූ ගනුදෙනු සිදු කිරීම
- ප්‍රාථමික අලෙවිකරුවන් නොවන ආයෝජකයන් සමඟ කරන ලද රුපියල් මිලියන 50 ඉක්ම වූ එක් එක් හිමිකම් පැවරූ එතැන් ගනුදෙනුවල ඵලදා අනුපාතිකය හා ප්‍රමාණය මිනිත්තු 30 ක් ඇතුළත වාර්තා කිරීම